# රසායනික පොහොර තහනමත් සමඟ ශ්‍රී ලංකාවේ වී ගොවිතැනට සිදුවන බලපෑම (ආහාර සුරක්ෂිතතාවය යටතේ තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය)

ඩී.බී මධූකා සෙව්වන්දි[1]

***අභිමතාර්ථය 02:*** කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය වැඩි දියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම

## 1. හැඳින්වීම

2030 වන විට ශ්‍රී ලංකාව තිරසාර රටක් කරා ගමන් කිරීමේදී අරමුණු 17ක් එයින් දෙවන අරමුණ වන සාගින්න තුරලීම යටතේ දේශීය කෘෂිකර්මාන්තය නගා සිටුවීම වැදගත් වේ. වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නිර්දේශයක් අනුව රසායනික පොහොර භාවිතය සම්පූර්ණයෙන්ම තහනම් කරන්නට විය. මෙම පර්යේෂණයේ ඇති වැදගත්කම වන්නේ මෙය කාලීන මාතෘකාවක් වීම මෙන්ම මෙම මාතෘකාව පදනම් කරගත් වෙනත් පර්යේෂණයක් දැකගැනීමට නොහැකි වීමයි. රසායනික පොහොර තහනමත් සමඟ දේශීය ගොවියා ගැටලු රැසකට මුහුණ පාන්නට විය. මේ හේතුව නිසා 2021 වර්ෂයේ මහ කන්නයේ වී ගොවිතැන බොහෝ සෙයින් කඩා වැටෙන්නට විය. පොහොර නොමැතිකමින් වී නිෂ්පාදනය බොහෝ සෙයින් පහළ බසින්නට විය. ඒ සමඟ වී මිල ඉහළ යෑමත්, සහල් මිල ඉහළ යෑමත් සිදු වන්නට විය. ඒ අනුව අධ්‍යයන ගැටලුව වන්නේ වී නිෂ්පාදනයට රසායනික පොහොර භාවිතය කෙතරම් අත්‍යවශ්‍ය වේද යන්නයි.

ආහාර සුරක්ෂිතතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා වී වගාව සැලකිය යුතු දායකත්වයක් සපයයි. කෙසේ වෙතත්, වී ගොවීහු බොහෝ ගැටලුවලට මුහුණ දී ඇත. සීඝ්‍රයෙන් වෙනස් වන සමාජ ආර්ථික හා ස්වාභාවික ගැටලු හමුවේ ගොවි ජනගහනයෙන් හරි අඩකට ආසන්න පිරිසක් දරිද්‍රතාවයෙන් පෙළෙමින් සිටී. කෘෂිකාර්මික කටයුතුවලදී පොහොර සපයාගැනීමේ දී සිදුවන අපහසුතා, දියුණු යන්ත්‍රෝපකරණ භාවිතා නොකිරීම, දියුණු වගා ක්‍රම භාවිතා නොකිරීම වැනි දේවල් නිසා ලැබෙන අස්වැන්න අඩු වීම වැනි ගැටළුවලට ද ගොවියා මුහුණදෙනු ලබයි. දිගින් දිගටම මතුවන ගැටළු නිසා ඇතැම් ගොවියන් වී ගොවිතැන අත්හැර වෙනත් වගාවන් සඳහා යොමුවී තිබේ. මෙම තත්ත්වය දිගින් දිගටම පැවතුණහොත් වසරකට අවශ්‍ය සහල් ප්‍රමාණය නිෂ්පාදනය කරගැනීමේ අපහසුතාවයක් ඇති වීමේ අවදානමක් ද තිබේ.

## 2. අධ්‍යයන අරමුණ

රසායනික පොහොර තහනමත් සමග ශ්‍රී ලංකාවේ වී ගොවිතැනට සිදුවන

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය
madukasewwandi890@gmail.com

බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ.

### *2.1 සෙසු අරමුණු*

1. වී ගොවීන් මුහුණපාන ගැටලු පිළිබඳ අධ්‍යයනය කිරීම
2. කාබනික පොහොර භාවිතය කෙතරම් දුරට සාර්ථකද යන්න අධ්‍යයනය කිරීම
3. නිෂ්පාදිත වී සදහා ප්‍රමාණවත් මිලක් ගොවීන්ට ලැබේද යන්න අධ්‍යයනය කිරීම
4. තිරසාර සංවර්ධන ඉලක්ක කරා යාමේදී වී ගොවිතැනේ බලපෑම පිළිබද විමසා බැලීම

## 3. සාහිත්‍ය විමර්ශනය

පසුගිය වසර දහය තුළ චීනයේ සහල් අස්වැන්න නිරීක්ෂණය කිරීමෙන්, එහි ජනගහනය ඉහළ යන විට ඒක පුද්ගල සහල් පරිභෝජනය වර්තමාන මට්ටමට පැවතුනහොත් එහි ගෘහස්ථ අවශ්‍යතා සපුරාලීම සඳහා 2030 වන විට චීනයෙන් 20%ක් පමණ වැඩිපුර සහල් නිෂ්පාදනය කළ යුතුව ඇත. මෙය පහසු කාර්යයක් නොවේ, මන්ද චීන සහල් නිෂ්පාදන ක්‍රමයේ පවතින ප්‍රවණතාවයන් සහ ගැටලු නිසා සමස්ත සහල් නිෂ්පාදනයේ තිරසාර බව වැඩිවීම සීමා වේ (Peng et al., 2009).

වී වගාව ශ්‍රී ලංකාවේ සමස්ත වගා බිම් ප්‍රමාණයෙන් 34%ක් එනම් හෙක්ටෙයාර මිලියන 0.77ක් වගා කරන ඉතා වැදගත් බෝගයකි. සාමාන්‍යයෙන් මහා කන්නයේදී හෙක්ටෙයාර් 560,000ක් සහ යල කන්නයේදී හෙක්ටෙයාර 310,000ක් වගා කෙරෙන අතර සාමාන්‍ය වාර්ෂිකව වපුරනු ලබන බිම් ප්‍රමාණය හෙක්ටෙයාර 870,000ක් පමණ වේ. දිවයින පුරා ගොවි පවුල් මිලියන 1.8ක් පමණ වී වගාවේ යෙදී සිටිති (Dent & Herath, n.d.)

වී වගාව සඳහා පොහොර සහනාධාරය ලබාදීම හේතුවෙන් වී වගාවේදී අක්කරයකට යෙදිය යුතු පොහොර සඳහා වැය වන වියදම අඩුවන අතර ඒ අනුව, වී කිලෝග්‍රෑම් ඒකක නිෂ්පාදන වියදම ද අඩු වී ඇත. තවද, නිෂ්පාදන වියදම සැලකිල්ලට ගැනීමේදී තම පවුලේ ශ්‍රමය භාවිතයට ගැනීමෙන් නිෂ්පාදන වියදම සැලකිය යුතු ප්‍රමාණයක් අඩුකර ගත හැක (සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘති ඇගයීම, 2013).

කෘෂිකර්මාන්තයේ පොහොර අත්‍යවශ්‍ය යෙදවුමක් බැවින්, ශක්තිමත් පොහොර සම්බන්ධ ප්‍රතිපත්ති කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම අරමුණු කරගත් ඕනෑම ජාතික ප්‍රයත්නයකට ඉතා වැදගත් වේ (Ekanayake, 2009).

මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ ප්‍රධාන පියවරක් වශයෙන්, ශ්‍රී ලංකා රජය 1962දී පොහොර සඳහා මිල සහනාධාරයක් හඳුන්වා දෙන ලදී. එහි

ප්‍රධාන සහනාධාර යෝජනා ක්‍රමය වූයේ හැකි තරම් ලාභදායීව පොහොර ලබා දීමයි. එහදී, පොහොර මිල අඩු වීමෙන් නිෂ්පාදන පිරිවැය අඩු වේ. ඒ මත පදනම්ව, පොහොර සහ අනෙකුත් යෙදවුම් සඳහා ඇති ඉල්ලුම වැඩි කරයි. වී නිෂ්පාදනයේදී වගාවට පොහොර යෙදීම අත්‍යවශ්‍ය වේ. බොහෝ කාලයක් එකම භූමියේ වගා කිරීම නිසා පස නිසරු වී තිබේ. මේ නිසා සරු අස්වැන්නක් ලබා ගැනීමට නම් පොහොර යෙදීම කළ යුතුය. මේ අතර ලංකාවේ කෘෂිකර්මාන්තය සම්පූර්ණයෙන්ම කාබනික පොහොර භාවිතයෙන් සිදු කිරීමටත් රසායනික පොහොර තහනම් කිරීමටත් ජනාධිපතිතුමා ක්‍රියා කිරීමත් සමඟ වී ගොවීන් පොහොර නොමැතිකමින් මහත් අපහසුතාවයට පත් වන්නට විය.

## 4. අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ප්‍රධාන වශයෙන් ප්‍රාථමික දත්ත භාවිතයෙන් සිදු කරනු ලබයි. එහිදී ලංකාවේ බහුල ලෙස වී වගා කරන අම්පාර දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ ගොවි පවුල් 100ක් පහසු නියැදුම් ක්‍රමය යටතේ තෝරා ගනු ලබයි. එහිදී ප්‍රශ්නාවලියක් භාවිතයෙන් අදාළ දත්ත ලබා ගැනීමට බලාපොරොත්තු වේ. මෙම පර්යේෂණයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විස්තරාත්මක සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රම යටතේ එන කයිවර්ග පරීක්ෂාව, සහසම්බන්ධතා විශ්ලේෂණය, ප්‍රතිපායන විශ්ලේෂණය ආදි විශ්ලේෂණ ක්‍රම දත්ත විශ්ලේෂණය සඳහා යොදාගනු ලැබිණ. ඊට අදාළ ආකෘතිය තෝරා ගැනීමේදී විසිරිතිත් සටහන මත $X$ හා $Y$ විචල්‍යයන්ගේ ව්‍යාප්තිය පදනම් කර ගනිමින් ගණිතමය ආකෘතිය තෝරාගනු ලැබීය. ප්‍රධාන වශයෙන් දත්ත විශ්ලේෂණය සඳහා SPSS, Excel මෘදුකාංග යොදාගන්නා ලදී.

## 5. නිගමන හා යෝජනා

මෙම පර්යේෂණයේ දත්ත විශ්ලේෂණය මගින් ලැබී ඇති ප්‍රධාන නිගමනය වන්නේ රසායනික පොහොර නොමැතිකමින් අනෙක් කන්නවලට සාපේක්ෂව 2021 මහ කන්නයේ වී අස්වැන්න බොහෝ සෙයින් අඩුවී ඇති බවයි. 50% ප්‍රතිශතයකින් වී අස්වැන්න අඩුවී ඇති බව නිගමනය වේ. කාබනික පොහොර පමණක් වී වගාවට භාවිතය අසාර්ථක බව නිගමනය කළ හැකිය. 2021 මහ කන්නයේ වී මිල බොහෝ සෙයින් ඉහළ ගොස් ඇත. යෝජනා ලෙස රසායනික පොහොර තහනම එකවර සිදු නොකර එය ක්‍රමානුකූලව සිදුකළ යුතු දෙයකි. රජය විසින් පාලන වී මිලක් නියම කළ යුතුය. වී ගොවින්ට පොහොර සහනාධාරය නැවත ලබාදිය යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ

ඇපාසිංහ, එස්. (2013). සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘති ඇගයීම, *ISBN:978-955-612-157-5*

Dent, F. J., & Herath, E. M. (n.d.). Bridging the Rice Yield Gap in he Asia-Pacific Edited by. *Office*.

Ekanayake, H. (2009). The Impact of Fertilizer Subsidy on Paddy Cultivation in Sri Lanka. *Staff Studies*, *36*(1), 73. https://doi.org/10.4038/ss.v36i1.1231

Peng, S., Tang, Q., & Zou, Y. (2009). Current status and challenges of rice production in China. *Plant Production Science*, *12*(1), 3–8.